# මානව ශාන්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය (NCAS)

# අයදුම්පත් කැඳවීම

# අධ්‍යක්ෂ තනතුර

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානයේ (NCAS) අධ්‍යක්ෂ තනතුර සඳහා 2024 ජනවාරි මස 01 වන දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මානව ශාස්ත්‍ර, සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය සැපයීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස මානව හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය 2005 අංක 02 දරන NCAS ආඥාපනත මගින් ස්ථාපිත කරන ලදී.

අධ්‍යක්ෂවරයා යනු මධ්‍යස්ථානයේ පූර්ණකාලීන නිලධාරියෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධාරියෙකු සහ ගිණුම්කරණ නිලධාරියෙකු වේ. අධ්‍යක්ෂවරයා කළමනාකරණ සභාවේ සභාපති වන අතර, මධ්‍යස්ථානයේ ශාස්ත්‍රීය කමිටුවල නිල බලයෙන් සාමාජිකයෙකි.

අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සහ මධ්‍යස්ථානයට ශාස්ත්‍රීය හා පරිපාලන නායකත්වය සැපයීම සඳහා වගකිව යුතුය. මධ්‍යස්ථානයේ කටයුතු කළමනාකරණය කිරීමේදී විනිවිදභාවය, වගවීම සහ යහපාලනය පවත්වාගෙන යාම සඳහා ද අධ්‍යක්ෂවරයා වගකිව යුතුය. නව්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමෙන් සහ මානව ශාස්ත්‍ර, සහ සමාජ විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම ඉහළ නැංවීමට ශාස්ත්‍රීය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට උපකාර කිරීමෙන් මධ්‍යස්ථානය එහි දැක්ම කරා යොමු කිරීමට අධ්‍යක්ෂවරයා වෙතින් අපේක්ෂා කෙරේ. අනෙකුත් විශ්වවිද්‍යාලවල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, අදාළ රේඛීය අමාත්‍යාංශවල සහ අනෙකුත් අදාළ ආයතනවල ශාස්ත්‍රඥයින් හා නිලධාරීන් සමඟ සන්නිවේදනය කිරීමට සහ සම්බන්ධීකරණය කිරීමට ද අධ්‍යක්ෂවරයාට හැකියාව තිබිය යුතුය.

**වැටුප:** අධ්‍යක්ෂවරයාට මසකට රු. 198,280 – 13 X 4,850 – 261,330/- පරිමාණයෙන් වැටුපක් හිමි වේ. (U – AC 5 (II) දැනට සේවයේ නියුතු අය ඔවුන්ගේ වත්මන් වැටුප් තලයට නොඅඩු වැටුප් තලයක් ස්ථානගත කරනු ලැබේ. රජයේ රෙගුලාසිවලට අනුකූලව නිල ප්‍රවාහන පහසුකම් සඳහා අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇත.

පත්වන අධ්‍යක්ෂවරයා පත් කළ දින සිට වසර තුනක (3) කාලයක් හෝ ඔහු/ඇය 65 වන උපන්දිනයට ළඟා වන තෙක්, ඉන් කුමන සිදුවීමක් කලින් සිදු වුවද, එම කාලය දක්වා තනතුරේ කටයුතු කළ යුතුය. පත්වන අයදුම්කරු ඔහුගේ/ඇයගේ ඉපයීම්වලින් 10%ක් විශ්වවිද්‍යාල සේවක අර්ථසාධක අරමුදලට දායක වන අතර, ආයතනය විසින් ඔහුගේ/ඇයගේ ඉපයීම්වලින් 15%කට සමාන මුදලක් මෙම අරමුදලට දායක කරනු ඇත.

පත්වීමේ නියමයන් සහ කොන්දේසි 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (සංශෝධිත පරිදි) සහ 2005 ඔක්තෝබර් 19 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 1415/17 මගින් ප්‍රකාශයට පත් කරන ලද 2005 අංක 02 දරන NCAS ආඥාපනතේ සහ 2008 සැප්තැම්බර් 15 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 1567/6 මගින් ප්‍රකාශයට පත් කරන ලද 2008 අංක 03 දරණ NCAS (සංශෝධන) ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව පාලනය වේ.

**අයදුම්කරු විසින් පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය:**

- 2024 ජනවාරි මස 01 වන දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 හි V වන කොටසේ දක්වා ඇති ලේඛන.
- උපන්දිනය ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද විස්තරාත්මක ජීවදත්ත පත්‍රය (Curriculum Vitae).
- ආයතනයේ සංවර්ධනය සඳහා ඔහුගේ/ඇයගේ දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ අධ්‍යක්ෂ තනතුරට පත් වුවහොත් අයදුම්කරු විසින් ඉටු කිරීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක්.
- අධ්‍යක්ෂ තනතුරට පත් වුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට වත්මන් සේවායෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරු වයස අවුරුදු 63 ට අඩු විය යුතුය.

අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන්ට කළමනාකරණ සභාව හමුවේ අවම වශයෙන් මිනිත්තු දහයක (10) කාලයක් නමුත් මිනිත්තු පහළොවකට (15) නොවැඩි කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා ආරාධනා කරනු ලැබේ.

අයදුම්පත් 2025.12.05 දින ප.ව. 3.30 ට හෝ ඊට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය, 6A, සුබස්ථාන උද්‍යානය, වෝඩ් පෙදෙස, කොළඹ-07 යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ මුද්‍රා තැබූ කවරයක අතින් භාර දීමෙන් එවිය යුතුය. එහි මෘදු පිටපතක් ද **(soft copy) sar@ncas.ac.lk** වෙත විද්‍යුත් තැපැලෙන් යැවිය යුතුය.

"අධ්‍යක්ෂ තනතුර" යන වචන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ, නොපැහැදිලි හෝ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**කළමනාකරණ සභාවේ ලේකම්, මානව හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය, (NCAS) 6A, සුබස්ථාන උද්‍යානය,**
**වෝඩ් පෙදෙස, කොළඹ 07.**